# STUDENT MEDICAL LEAVE APPLICATION FORM
# FOR ACADEMIC ACTIVITIES

01. Name : Mr/Miss …………………………………………………

02. Registration No: …………………… 03. Batch : ……………………..

04. Period of medical leave: From : ……………… To : ……………………

05. Academic activity/ activities, missed during above period

| | Department/s | Lectures | Practical | Tutorials | Clinical | In course assessment |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

Have you submitted a medical certificate for an examination before : Yes/ No

If yes, please specify:
……………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………………..

I certify above information is correct.

Date: ………………………..                                                ……………………………

Signature

**This form should accompany a duly signed medical certificate within 14 days of commencing your leave .**

රුහුණු විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර ශිෂ්‍යයන් විසින් වෛද්‍ය හේතූන් මත නොපැමිණීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම සඳහා අදාල නිර්ණායකයන් :

1. වෛද්‍ය හේතූන් මත උපාධි පරීක්ෂණ, දේශන සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් වලට පෙනී නොසිටීම.
වෛද්‍ය හේතූන් මත විභාග වලට පෙනී නොසිටීම සම්බන්ධව වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් විධිවිධාන අනුගමනය කල යුතුය.

1.1 ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික අදාල පීඨ වෛද්‍ය නිලධාරී හෝ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීයෙකු හෝ විශේෂඥ වෛද්‍ය නිලධාරීයෙකු හෝ රජයේ ආරෝග්‍ය ශාලා ප්‍රධානියකු හෝ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීයෙකු (MBBS උපාධිධාරීන්) හෝ රජයේ ප්‍රාදේශීය ආයුර්වේද රෝහලක වෛද්‍ය පරිපාලකයෙකු හෝ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍ය නිලධාරීයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් විය යුතුය.

1.2 ඉහත සියළු වෛද්‍ය සහතික රජයේ ආකෘති පත්‍රයක හෝ පීඨය විසින් වෙබ් අඩවියේ පලකර ඇති ආකෘතිය පදනම්ව ලිපි ශීර්ෂ සහිතව නිල මුද්‍රාවක් සහිතව නිකුත් කරන ලද විධිමත් වෛද්‍ය සහතිකයක් විය යුතුය.

1.3 ඉදිරිපත් කරනු ලබන එක් වෛද්‍ය සහතිකයක් උපරිම දින 14 ක් දක්වා පමණක් ඉදිරිපත් කල යුතු අතර වෛද්‍ය හේතූන් මත තවදුරටත් නිවාඩු අවශ්‍ය වන්නේ නම් නැවතත් විධිමත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

2. වෛද්‍ය හේතූන් මත යම් ශිෂ්‍යයෙකුට විභාගය සඳහා පෙනී සිටිමට නොහැකි වන්නේ නම් ඒ බව වහාම විදුලි පුවතක් මගින් අදාල පීඨයේ පීඨාධිපතිට, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීට හෝ සහකාර ලේඛකාධිකාරී වෙත දැන්විය යුතුය. හැකි ඉක්මනින් අදාල වෛද්‍ය සහතිකය ඉදිරිපත් කල යුතු අතර එම කාලය වෛද්‍ය නිවාඩු අවසන්නව පිඨයට වාර්තා කල දින සිට සති 02 ක් නොඉක්ම විය යුතුය.

3. වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම.
වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් නිර්නායක අනුගමනය කල යුතුය.

3.1 යම් කිසි ශිෂ්‍යයෙකුට වෛද්‍ය හේතූන් මත විශ්වවිද්‍යාල ප්‍රවේශය කල් ගැනීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කරන්නේ නම් අඛණ්ඩව හෝ කඩවීම් සහිතව එම වෛද්‍ය සහතික මගින් අවම වශයෙන් සති 06 ක (වැඩ කරන දින30 ක කාලයක්) ආවරණය විය යුතුය. ඉදිරිපත් කරන වෛද්‍ය සහතිකය 1.1 උප වගන්තියෙහි සඳහන් වෛද්‍ය නිලධාරීයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් විය යුතු අතර 1.2 උප වගන්තියෙහි සඳහන් නිර්ණායකයන් අනුව ඉදිරිපත් කරන වෛද්‍ය සහතිකයක් විය යුතුය.

4. වෛද්‍ය සහතික මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම
වෛද්‍ය සහතික මාර්ගගත ක්‍රමය ඔස්සේද ඉදිරිපත් කල යුතුය. ලබා දී ඇති උපදෙස් පරිදි https://paravi.ruh.ac.lk/fomemis/index.php යන සබැඳියෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කල යුතුය. වෛද්‍ය සහතිකය ඉදිරිපත් කල පසු ලැබෙන යොමු අංකය (Reference Number) ශිෂ්‍යයා සතුව ආරක්ෂිතව තබා ගත යුතුය.

5. වෛද්‍ය සහතික අනුමත කිරීම.
ශිෂ්‍යයන් විසින් ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික අනුමත කිරීමේදී පහත ක්‍රියා පිළිවෙත අනුගමනය කල යුතුය

5.1 ශිෂ්‍යයන් විසින් තම වෛද්‍ය සහතිකය කළමණාකරණ තොරතුරු පද්ධතිය (MIS) හරහා ඉදිරිපත් කල යුතු අතර එම වෛද්‍ය වාර්තාව සහ ඊට අදාල අයදුම්පත වෛද්‍ය පීඨ පරිපාලන අංශය වෙත භාර දිය යුතුවේ. (වෛද්‍ය නිවාඩුව අවසන් දින සිට සති 02 ක කාලයක් තුල) ඔබ විසින් පරිපාලන අංශය වෙත බාර දෙනු ලබන අයදුම්පත සහ ඔබ විසින් කළමණාකරණ තොරතුරු පද්ධතිය (MIS) හරහා අයදුම් කර ඇති අයදුම් පත පරීක්ෂා කිරීමෙන් අනතුරුව අනුමැතිය සඳහා වෛද්‍ය සහතික පීඨ වෛද්‍ය නිලධාරීයාට යොමු කරනු ඇත. ඉහත අංක 1 යටතේ ඉදිරිපත් කරන වෛද්‍ය සහතික සම්බන්ධ තීරණ අධ්‍යයනාංශ ප්‍රධානීන් වෙත යොමු කරනු ඇත.

5.2 ඉහත අංක 2 යටතේ ඉදිරිපත් කරනු ලබන වෛද්‍ය සහතික සඳහා පීඨ වෛද්‍ය නිලධාරියා විසින් ලබාදෙන තීරණ පීඨ මණ්ඩලය වෙත යොමු කරන අතර පීඨ මණ්ඩල නිර්දේශය සනාතන සභාව වෙත යොමු කෙරේ. සනාතන සභා තීරණය ශිෂ්‍යායාට ලිඛිතව දැනුම් දිය යුතු අතර අදාල තීරණයන්හි පිටපතක් එම ශිෂ්‍යයාගේ ශිෂ්‍ය පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම සඳහා අදාල අංශය වෙත යැවිය යුතුය.